# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය - 2012

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දැක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරිය සතු වර්ග ප්‍රමාණය හෙක්ටයාර් 7.3749 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර නොතිබූ අතර එම වත්කම් වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින්ද හෙළිදරව් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය සතු ඉඩම්වල වටිනාකම රු.38,100,000 කට තක්සේරු කර තිබූ අතර, එම වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) උපකරණ ක්ෂය වීම් රු.155,209 ක් අඩුවෙන් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

#### 1.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

මුදල් රෙගුලාසි 371(2)(ආ) ප්‍රකාරව ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්යය නිමවූ වහාම පියවිය යුතු වුවත්, නිලධාරින් 42 කුට නිකුත් කර තිබුණු එකතුව රු.1,970,866 ක්වූ තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්යය නිමවී මාස 1 සිට මාස 11 ත් අතර කාල පරාසයක් ප්‍රමාදවී පියවා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.21,424,115 ක් ඌණතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු.25,754,103 ක් වූයෙන් ඌනතාවය රු.4,329,988 කින් හෙවත් සියයට 17 කින් අඩුවී තිබුණි. ඌනතාවය අඩුවීමට අදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 2.2 වියදම්වල වැඩිවීම

අධිකාරියේ වියදම් අතුරින් පහත සඳහන් වියදම් 2011 වර්ෂයට සාපේක්ෂව වැඩිවී තිබුණි.

| වියදම් විස්තරය | 2012 | 2011 | වියදම වැඩිවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | % |
| සුහසාධන වියදම් | 1,268,398 | 799,444 | 59 |
| තැපැල් ගාස්තු | 461,123 | 194,997 | 136 |
| ගිවිසුම්ගත සේවා | 3,912,558 | 2,260,708 | 73 |
| අනෙකුත් සැපයුම් | 1,115,976 | 224,390 | 397 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

2009, 2010, 2011 හා 2012 වර්ෂවල මිරිදිය හා කිවුල්දිය මත්ස්‍ය නිෂ්පාදනය පහත පරිදි වී තිබුණි.

| වර්ෂය | කිවුල්දිය මත්ස්‍ය නිෂ්පාදනය | මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය |
|---|---|---|
| | මෙ.ටොන් | මෙ.ටොන් |
| 2009 | 293,170 | 46,560 |
| 2010 | 330,240 | 51,390 |
| 2011 | 381,260 | 59,560 |
| 2012 | 417,220 | 68,950 |

2011 ට සාපේක්ෂව 2012 වර්ෂයේ කිවුල්දිය මත්ස්‍ය නිෂ්පාදනයේ වර්ධනය සියයට 9.4 ක් වන අතර මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයේ වර්ධනය සියයට 15.8 ක් වී තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විසිතුරු මත්ස්‍ය වගාව සංවර්ධනය කිරීම සඳහා 2012 අයවැය යෝජනා යටතේ " වෙබ් අඩවිය" වෙනුවෙන් රු.මිලියන 1.7 ක් වෙන්කර දී තිබුණත් ඒ සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ආ) නොමිලේ තැන්පත් කිරීම සඳහා පෞද්ගලික අංශයෙන් ඇඟිල්ලන් මිලදී ගැනීමේදී නියමිත ප්‍රමිතියට අදාලව ගෙවීම්කර ඇඟිල්ලන් මිලදී ගෙන නොතිබුණි.

(ඇ) ඇසිත්තන් තැන්පත් කර ඇඟිල්ලන් ලබා ගැනීමේදී පොකුණුවල ධාරිතාවය ඉක්මවා ඇඟිල්ලන් තැන්පත් කළ බව දන්වා මුදල් ඉල්ලීම් කර තිබුණි.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණු තනතුරු 41 ක් සඳහා බඳවාගැනීම් සිදුකර නොතිබුණි.

(ඉ) පුද්ගලික සමාගමක් වෙත බදු දී තිබූ පොළොන්නරුව මිරිදිය ධීවර මධ්‍යස්ථානය නියමිත කාලය අවසන් වීමට පෙර 2009 මාර්තු 24 දින අධිකාරිය විසින් නැවත පවරාගැනීම හේතුකොටගෙන අධිකාරිය වෙත ලැබීමට ඇති රු.555,468 ක් 2012 දෙසැම්බර් 31 දින වනවිටත් ලබාගැනීමට නොහැකි වී තිබුණි.

(ඊ) ව්‍යාප්ති නිලධාරී, ප්‍රාදේශීය ව්‍යාප්ති නිලධාරී හා දිස්ත්‍රික් ව්‍යාප්ති නිලධාරීන් හරහා ණය පදනම මත මත්ස්‍ය පැටවුන් ලබාදීම තුළින් 2012 දෙසැම්බර් 31 දිනට අයවීමට ඇති ණය ශේෂය රු.2,028,925 ක් වී තිබූ අතර 2013 මැයි මස අවසානය වනවිට තවදුරටත් රු.1,675,596 ක් අයකරගත යුතුව පැවතුණි.

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනයේ රාජකාරී හා වගකීම් නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා සුදුසු කාර්යමණ්ඩලය අනුමත කර සේවයේ යොදවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණයවූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුව ඇත.

(අ) වත්කම්

(ආ) අත්තිකාරම්

(ඇ) ණය පදනම මත මත්ස්‍ය නිෂ්පාදන අළෙවි කිරීම

(ඈ) බදු මුදල් අයකර ගැනීම

(ඉ) කාර්ය මණ්ඩල